**සංක්ෂිප්ත ප්‍රතිපත්ති සටහන**

LAW & SOCIETY TRUST

# වධහිංසාවලට මුහුණ දී දිවිගලවාගත්තැනැත්තන් සඳහා ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ආරක්ෂාව හඳුන්වාදීම

**2021 ජූනි**

ශ්‍රී ලංකාවේ සිටින වධහිංසාවලට මුහුණ දී දිවිගලවාගත් තැනැත්තන් සහ ඔවුන්ගේ පවුල් මුහුණ දෙන විශේෂිත අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා, වධහිංසාවලට මුහුණ දී දිවි ගලවාගත් තැනැත්තන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ඇති ප්‍රතිපත්තියක අවශ්‍යතාවය  මෙම සංක්ෂිප්ත සටහන මගින් ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත අවධාරණය කරයි. එසේ දිවි ගලවාගත් තැනැත්තන් අත්විඳින බහුවිධ වූ පුද්ගලික, සමාජමය හා බාහිර අභියෝග සහ රජයෙන් ලබාදෙන ආරක්ෂාවෙහි ඇති අඩුපාඩු විස්තර කෙරෙන අධ්‍යයනයක් පදනම් කරගෙන මෙම සංක්ෂිප්ත සටහන සම්පාදනය කර තිබේ.

## හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ නීති හා ප්‍රතිපත්ති රාමුව වධහිංසා කිසිසේත්ම නොඉවසීම සඳහා කැපවී ඇති අතර, 1994 අංක 22 දරන වධදීමට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිවූ සම්මුතිය පනත (වධදීමට එරෙහි පනත) යටතේ සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය සඳහා වන 2017-2022 ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලස්ම යටතේ වධහිංසාව තහනම් කර තිබේ. ශ්‍රී ලංකාව වධහිංසාවලට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවට පුද්ගල පැමිණිලි භාරගැනීමටත් සලකාබැලීමටත් ඇති නීත්‍යානුකූල බලය පිළිගනිමින්2016 අගෝස්තු මාසයේ සිට වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ පාර්ශවකරුවකු වන අතර, 2018 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකාව වධහිංසාවලට එරෙහි සම්මුතියේ වෛකල්පික මූලලේඛය ද (OPCAT) පිළිගෙන තිබේ.

කෙසේනමුත්, මෙම පොරොන්දු සහ ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන අත්දැකීම් අතර විශාල පරතරයක් තිබේ. සැබැවින් ම, රාජ්‍ය නිලධාරීන් විසින් වධහිංසා සහ පීඩා පැමිණවීමේ පිළිවෙත පද්ධතිගතව සහ පුළුල්ව සිදුවන බව ජාත්‍යන්තර සහ දේශීය මානව හිමිකම් ආරක්ෂකයින් විසින් යළි යළිත් පිළිගෙන තිබේ. එමෙන්ම, බරපතළ සහ පෑථුල ස්වභාවයේ ප්‍රචණ්ඩත්වයට එළදයී ආයතනික ප්‍රතිචාර දැක්වීම් සම්පාදනය කිරීමට ද ශ්‍රී ලංකාව ඓතිහාසිකව අසමත් වී තිබේ.  එමෙන් ම, නිවෙස්වල, පාසල්වල, උසස් අධ්‍යාපන ආයතනවල සහ ආගමික ආයතනවල සිදුවන ප්‍රචණ්ඩත්වය ද එළදයී අන්දමින් ආමන්ත්‍රණය කිරීම සඳහා ද මෙරටට බලවත් පරිශ්‍රමයක්දැරීමට සිදුවී තිබේ.

වධදීමට එරෙහි පනත බලාත්මකව තිබූ පසුගිය 26 වසර තුළ වධහිංසා වරද සඳහා නඩු පවරන ලද අවස්ථා ඇත්තේ 47ක් වන අතර ඉන් පුද්ගලයින් වරදකරුවන් වී ඇත්තේ අවස්ථා 9ක දී පමණි. එයින් ද නඩු 6ක් සම්බන්ධයෙන් දැනට අභියාචනා පවතියි.[1] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිලි හා සසඳන කල,[2]සිදුකරනුලබන පැමිණිලි අතරින් දළ වශයෙන් 99%ක් සම්බන්ධයෙන් නඩුපැවරීමක් සිදු නොවන අතර එයින් ද වරදකරුවන් බවට පත්වන්නේ සියයට දෙකකටත් (0.2%) අඩු ප්‍රතිශතයකි.[3] පුද්ගලයින් කලකිරීමට පත්කරවනසුළු අත්දැකීම් සහිත, වින්දිතයින්ට හා සාක්ෂිකරුවන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැති, සහ දීර්ඝ කාලීන ප්‍රමාදයන් සහිත ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති පද්ධතිය මේ සඳහා අර්ධ වශයෙන් වගකිව යුතු වේ.[4] වධහිංසාවට ලක් වී දිවි ගලවාගත් තැනත්තන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අත්දැකීම් ස්ථානගත වන්නේ ප්‍රචණ්ඩත්වය පිළිගනු ලබන, වරදට දඬුවම් නොලබා සිටීම් බහුල, සහ සහන ලබාගැනීමට දරන වෑයම් දුර්වල අධිකරණ පද්ධතියක් තුළකතිකා කෙරෙන සමාජ සහ ආයතනික සන්දර්භයක් තුළ ය.

1. නීතිය හා සමාජ භාරය නීතිපතිවරයා වෙත ඉදිරිපත් කළ තොරතුරු දැනගැනීමේ අයදුමකට ලැබුණු ප්‍රතිචාරය, 2018 ජූලි.
2. වසර 8ක් තුළ (2010 ජනවාරි සහ 2018 දෙසැම්බර්)  වධහිංසා සහ පීඩාකාරී සැලකීම් සම්බන්ධයෙන් පැමිණිලි 4,362ක් ලැබුණු බව මානව හිමිකම් කොමිසම වාර්තා කරයි. වධහිංසාවලට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව වෙත 2016 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ඉදිරිපත් කළ වාර්තාවෙන් https://www.hrcsl.lk/ wp-content/uploads/2020/01/Report-to-CAT-Committee-.pdfසහ මානව හිමිකම් කොමිසමේ වෙබ් අඩවියේ  පැමිණිලි සම්බන්ධයෙන් ඇති සංඛ්‍යාලේඛන වලින් උපුටා ගත් තොරතුරු.
3. මෙම අගයන් වසර 26ක් තුළ සිදුකළ නඩු පැවරීම් සම්බන්ධයෙන් නීතිපති කාර්යාලයෙන් ලබාදුන් තොරතුරු සහ මානව හිමිකම් කොමිසම වෙත වසර 8ක් තුළ ලැබූ පැමිණිලි සංඛ්‍යාව සමග සසඳයි.එහි අර්ථය නම් වරදකරුවන් වීමේ ප්‍රතිශතය ඇත්ත වශයෙන්ම එයටත් අඩු බවකි.
4. 'නීති කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් නිකුත් කළඅපරාධ යුක්තිය සීඝ්‍රයෙන් හා කාර්යක්ෂමව පසිඳලීම සම්බන්ධයෙන් සිදුකරන නිර්දේශ නැමැති 2017 සැප්තැම්බර් 20වැනි දින දරන  වාර්තාවට අනුව බරපතළ අපරාධ නඩුවක් අවසන් වීම සඳහා සාමාන්‍යයෙන් වසර 17ක් පමණ ගත වේ. 2020 දෙසැම්බර් වන විට, විසි වසරකට වඩා වැඩි කාලයක් විභාග වෙමින් පැවති නොවිසඳුනු නඩු 4,620ක් ශ්‍රී ලංකාවේ අධිකරණවල පවතින බව නිව්ස්වයර් සඳහන් කරයි - shorturl.at/ dyL58

## වධහිංසාවට මුහුණ දී දිවි ගලවාගත් තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ ඇති ආරක්ෂාව පිළිබඳ සොයාගත් කරුණුවල සාරාංශය

**දිවි ගලවාගත් තැනැත්තන්ගේ අත්දැකීම්**

- විවිධ ස්වරූපවල ශාරීරික හා මානසික වධහිංසා
- සාක්ෂිදීමේ දුෂ්කරතා
- විවිධාකාරයේ සහය අවශ්‍ය වේ
- බහුවිධ ආකාරවලින් පළිගැනීම්

**සමාජ සාධක**

- වධහිංසාව සාමාන්‍යකරණය
- බොහෝ වින්දිත කණ්ඩායම්වලන මහජන සහය නොලැබීම

**රජයේ ප්‍රතිචාරය**

- ආරක්ෂණ සේවා නොමැතිවීම
- සහාය නොමැතිවීම

**ආරක්ෂණ අවශ්‍යතා**

- යථාතත්වයට පත්වීමට වින්දිතයා කේන්ද්‍ර කර ගත්සාකල්‍යප්‍රවේශය
- යුක්තිය සහ සුරක්ෂිත හා ඵලදායී ප්‍රවේශය (යළි වින්දිතවීම සහ පළිගැනීම් වැලැක්වීමට)

## පර්යේෂණය

වධහිංසා සහ පීඩාකාරී සැලකිලිවලට මුහුණ දී දිවි ගලවාගත් තැනැත්තන් වෙනුවෙන් පවතින නිල ආරක්ෂණ යන්ත්‍රණ, එම ආරක්ෂණ යන්ත්‍රණ කරා ප්‍රවේශවීමේදී මානව හිමිකම් සංවිධාන සහ වධහිංසා හා පීඩාකාරී සැලකිලිවලට මුහුණ දී දිවි ගලවාගත් දුගී ප්‍රජාවල සාමාජිකයින් ලැබූ ප්‍රායෝගික අත්දැකීම්, තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂණ ක්‍රියාමාර්ග ලබාගැනීමට එම ප්‍රජාවන්හි සාමාජිකයින් වෑයම් දරන විවිධ ආකාර, සහ ඔවුන් ලබන ආරක්ෂාවෙහි ඇති අඩුපාඩු අවබෝධ කරගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ අධ්‍යයනයක් සිදුකරන ලදී.  මේ සඳහා යොදගත් ක්‍රමවේදයට නීතිමය රාමුව සමාලෝචනය කිරීම, ගත වූ දස වර්ෂය ආවරණය කරමින් ශ්‍රී ලංකාවේ වධහිංසාව පිළිබඳ ලියැවුණු වාර්තා සමාලෝචනය කිරීම, මනෝවිද්‍යාඥයින්, වෛද්‍ය වෘත්තිකයින්, නීතිවේදීන්, පර්යේෂකයින් හා ක්‍රියාධරයින් සමගින් සිදුකළ ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා හා වධහිංසාවට ලක් වී දිවි ගලවාගත් තැනැත්තන් හා ඔවුන්ගේ පවුල්වල අය සම්බන්ධයෙන් සිදුකළ සිද්ධි අධ්‍යයන තුනක් ඇතුළත් විය.

## සොයාගත් කරුණු

1. **විවිධස්වරූපවල වධහිංසා (ශාරීරික, මානසික සහ ලිංගික):**වධහිංසාවලට මුහුණ දී දිවිගලවාගත් අය අපහාසාත්මක වදන්, තර්ජන, අවමන්, බියවැද්දීම්, තල්ලු කිරීම හා කම්මුල් පහර, පහරදීම, පා පහර, පාගාදැමීම, ඇඳුම් ගලවා දැමීම, ලිංගික අපයෝජන හා හිංසන, බැටන් පොලු, ලී හෝ උණ දඬු, දර ලී, කණු හෝ විකට්, වයර් හා ලෝහ දම්වැල් වැනි උපකරණ භාවිතයෙන් වේදනාව ඇතිකිරීම, දණ ගැස්වීම, දණහිස් වලින් ඇවිද්දවීම, පා පතුල්වලට පහර දීම, මහපට ඇඟිලිවලින්, මණික් කටුවෙන් හා වළලුකරෙන් එල්ලා තැබීම, පිළිස්සීම්, විවිධ ආකාරවලින් හුස්ම හිර කිරීම, සහ මිරිස් කුඩු හෝ පෙට්‍රෝල් භාවිතයෙන් දැවිල්ල ඇතිකිරීම අත්විඳ තිබුණි. තව ද, ප්‍රසිද්ධියේ  පහරදීම හෝ මාංචු දැමීම හරහා අවමානයට පත් කිරීම, අත් අඩංගුවට ගන්නා හා වැටලීම් කරන අවස්ථාවල මාධ්‍ය යොදගැනීම, දිවි ගලවාගත් අය හෝ පවුල් සම්බන්ධයෙන් අවමන්සහගත ප්‍රසිද්ධ නිවේදන හා පණිවුඩ, සහ වධහිංසා සිදුකරන අතරේ ඔවුන්ට සිනාසීම  යන අත්දැකීම් ද ඔවුන් ලබා තිබුණි. ආහාර, ජලය සහ නින්ද අහිමිකිරීම් සම්බන්ධයෙන්  ද දිවි ගලවාගත් තැනැත්තන් වාර්තා කර තිබුණි.

2. **සාක්ෂිදීමේ දුෂ්කරතා:** වධහිංසාවට ලක් වී දිවි ගලවාගත් තැනැත්තන් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කථා කිරීමේදී ඔවුන් අසරණ බවක්, ලජ්ජාවක් සහ බියක් අත්විඳිති. එසේම, ඔවුන් විඳි දුක්පීඩා සහ ඔවුන්ගේ අවදානම්සහගත භාවයඔප්පු කර ගැනීමට හැකියාවක් ද ඔවුන්ට නොතිබුණි. එම ඉතාමත් පෞද්ගලික වූ අත්දැකීම සම්බන්ධයෙන් සිතාබලා  එය සිදු වූයේ ඇයි, එහි අර්ථය කුමක්ද, එය අන් අය සමගින් බෙදාගත හැකිද සහ අන් අය ඒ දෙස කුමන ආකාරයකින් බලාවි ද යන්න අවබෝධ කර ගැනීමට බොහෝවිට දීර්ඝ කාලයක් ගත වේ. මෙවැනි දෑ සඳහා මුහුණ දී දිවි ගලවාගත් බොහෝදෙනා දුගී තැනැත්තන් වන අතර ඔවුන්ට ඇත්තේ සීමිත සමාජ හා දේශපාලන බලයක් වන බැවින් ඔවුහු පැමිණිලි කිරීමට ද නොයති. ලිංගික ප්‍රචණ්ඩත්වය යනු වධහිංසා ස්වරූපයක් බව හඳුනාගැනීම සඳහා අවශ්‍ය කරන විනිශ්චයමය නොවන සහාය ද මොවුන්ට නොලැබේ.

3. **අවශ්‍ය කරන බහුවිධ සහාය:**

   **අ. ශාරීරික, මානසික, සමාජ හා ආර්ථික වශයෙන් යථාතත්වයට පත්වීම සඳහා සහාය:** ඔවුන්ගේ ශාරීරික සහ මනෝ-සමාජීය සෞඛ්‍ය, ඔවුන්ගේ පවුල සහ සමාජ සම්බන්ධතා, ඔවුන්ගේ ජීවනෝපාය සහ මුල්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් පුද්ගලිකව නැවතත් යථා තත්වයට පැමිණීම සඳහා දිවි ගලවාගත් තැනැත්තන්ට සහාය අවශ්‍ය වේ. තමන්ගේ ගරුත්වය අහිමි වූ බවට වන හැඟීම තුරන් කර යථා තත්වයට පත්වීම සඳහා ද උපකාර අවශ්‍ය වේ. එසේ ලබාදෙන සහාය තුළ, ස්ථිර සහ දීර්ඝ කාලීන ශාරීරික හා මනෝසමාජයීය අබාධිතභාවය සඳහා සහ අන්තර්-පරම්පරාමය හානිය සඳහා ප්‍රතිචාර දැක්විය යුතු වේ. එමෙන් ම ද්විතියික වින්දිතයින් බවට පත් වූ පවුලේ සමාජිකයින් හා මිතුරන්ට ද සහාය අවශ්‍ය වේ.

   **ආ. සහන සපයන නිල ආයතන සමගින් සම්බන්ධවීම සඳහා සහය:** පැමිණිලි ඉදිරිපත් කර ඇත්නම් එයට අදාළ ආයතන සමගින් කටයුතු කිරීමට සහ එම ක්‍රියාවලිය සහ එයින් ලැබියහැකි ප්‍රතිඵල අවබෝධ කරගැනීමට දිවිගලවාගත් තැනැත්තන්ට සහාය අවශ්‍ය වේ. නැවත ක්ෂතියට පත්වීම,එනම් තමන් ලැබූ පීඩාකාරී අත්දැකීම් නැවත නැවතත් විස්තර කිරීමට සිදුවීමත් සමගින් ඇතිවන පීඩාව අවබෝධ කරගැනීම, බලයේ සිටින පුද්ගලයින් විසින් තමන්ව විශ්වාස නොකිරීම, බැණවැදීම සහ තර්ජනය කිරීම අත්විඳින්නට සිදුවීම, නීතියෙන් නියම කර ඇති කාල සීමාවන් පදනම් කරගනිමින් තමන්ගේ පැමිණිල්ල භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම වැනි ආයතනික අභියෝගවලට මුහුණ දීම සඳහා ඔවුන්ට සහාය අවශ්‍ය වේ. එසේම, බොහෝවිට ඔවුන්ට නීති නියෝජනය සහ නඩු කටයුතු සඳහා සහය අවශ්‍ය වේ.

4. 4. **බහුවිධ ආකාරවලින් පළිගැනීමට ලක්වීම:**

   **අ. ගොතන ලද චෝදනා සම්බන්ධයෙන් වගඋත්තර දෙන්නට සිදු වීම:** වධහිංසාවට ලක් වී දිවි ගලවාගත් තැනැත්තන්ට එරෙහිව බොහෝ අවස්ථාවලදී නීති විරෝධී මත්පැන් හෝ මත්ද්‍රව්‍ය ලඟ තබගෙන සිටීම හෝ රජයේ නිලධාරියකුගේ රාජකාරියට බාධා කිරීම වැනි කරුණක් අරභයා ව්‍යාජ අපරාධ චෝදනා එල්ල කෙරේ. මෙය එක්තරා දඬුවම් කිරීමේ ක්‍රමයක් හෝ වධහිංසා සම්බන්ධයෙන් පැමිණිලි කිරීම අධෛර්යවත් කිරීම සඳහා සිදු කරන්නක් බව පෙනෙයි. දිවි ගලවාගත් තැනැත්තන්ට මුලින්ම එම නඩු සම්බන්ධයෙන් කටයුතු කරීමට සිදු වේ: එනම්, අධිකරණයේ එම නඩුවලට පෙනී නොසිටියහොත් නැවතත් අත් අඩංගුවට පත්වීමේ තර්ජනය සහ ගොතනලද නැතහොත් බොරු සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් හෝ වෙනත් දූෂිත ව්‍යවහාරයක් හේතුවෙන් සිරදඬුවම් ලබන්නට වේ යැයි ඇති බිය සඳහා ඔවුන් මුහුණ දිය යුතු ය. නීති පද්ධතියේ ඇති ප්‍රමාදයන් හේතුවෙන් ඔවුන් අපේක්ෂා භංගත්වයට, මූල්‍ය, ශාරීරික හා චිත්තවේගීය පීඩනයට, සහ අපකීර්තියට සහ තමන්ගේ ප්‍රජාවේ හා ඇතැම්විට පවුලේ සහය අහිමිවීමට ලක් වෙති.

   **ආ. තර්ජන, හිංසන සහ බලහත්කාරය:** දිවිගලවාගත් තැනැත්තන් තවදුරටත් ප්‍රචණ්ඩත්වය, තමන්ගේ පවුලේ සාමාජිකයින් සහ නිවසේ භෞතික සුරක්ෂිතභාවය වෙත එල්ල වන තර්ජන, සහ තමන්ගේ ජීවනෝපායය හා මූල්‍ය ආරක්ෂිතබව අහිමිවීම වැනි තත්වයන්ට මුහුණ දෙති. එසේම, වරදකරුවන් අතින්, වරදකරුවන් නියෝජනය කරන ආයතනයේ අනෙක් අය අතින්, සහ විදුහල්පතිවරුන් හා ආගමික නායකයින් වැනි වරදකරුවන් වෙනුවෙන් පෙනී සිටින ප්‍රජා නායකයින් අතින් පවා බලහත්කාරයට ලක්වීට ද ඔවුන් මුහුණ දෙනු ලැබේ. අවස්ථා කිහිපයකදී, පළිගැනීමේ අවසාන ප්‍රතිඵලය ලෙස දිවි ගලවාගත් තැනැත්තාව මරා දමා තිබේ. දිගින් දිගටම එල්ලවන හිංසන හේතුවෙන් ඇතැම් අය තනිවම හෝ පවුලේ සියළුදෙනා සමගින් ස්ථිර ලෙසම වෙනත් ප්‍රදේශය වල පදිංචියට ගිය අවස්ථා තිබේ. එම ප්‍රදේශවලම රැඳී සිටින්නට තීරණය කළ අයට දීර්ඝ කාලයක් තිස්සේ හිංසනවලට මුහුණ දෙන්නට සිදුව ඇත.

   **ඇ. සමාජ සහාය බිඳදැමීම**: වධහිංසාවට මුහුණ දී දිවිගලවා ගත් තැනැත්තන් ප්‍රසිද්ධියේ ලජාවට පත්කිරීම් සහ ඔවුන්ව සමාජයේ හුදෙකලා කිරීමට ප්‍රයත්න දැරීම් අත්විඳ තිබේ. දිවි ගලවාගත් තැනැත්තා හෝ ඔහුගේ/ ඇයගේ පවුලේ අය මත්ද්‍රව්‍ය ජාවාරම් කරන බව, ඒ තැනැත්තා මානසික රෝගියකු බව කීමට සහ පවුලේ අයට හා හිතවතුන්ට මේ තැනැත්තා අපරාධකරුවකු බව කීමට වරදකරුවන් විසින් කටයුතු කර තිබේ. මෙය, තමන්ගේ කලත්‍රයා සහ දරුවන් සමගින් එම තැනැත්තාට ඇති සබඳතාවයට බලපා තිබේ. දිවි ගලවාගත් තැනැත්තන්ට සහය ලබාදීම අධෛර්යමත් කිරීමට හෝ ඔවුන් අපකීර්තියට පත් කිරීමට ප්‍රජාවේ නායකයින්ට බලපෑම් ඇති කර තිබේ.

5. **වධහිංසාව සාමාන්‍යකරණය:** එනම්, වධහිංසාමය සැලකිලි අසාමාන්‍ය දෙයක් ලෙස හෝ ප්‍රචණ්ඩක්‍රියා ලෙස පිළිනොගැනීමයි. එය, පිළිගතහැකි සැලකිල්ලක් වශයෙන් සාධාරණීකරණය කරනු ලැබේ. ඒ පිළිබඳව සඳහන් කිරීමට තරම් එය වැදගත් නොවන බවක්, පැමිණිලි කිරීමක් හෝ පැමිණිල්ලක් කිරීමේ අවදානම ගැනීමට තරම් බරපතල නොවන දෙයක් ලෙස ඊට මුහුණ දී දිවි ගලවගත් තැනැත්තන් විශ්වාස කරයි. එහි අර්ථය වන්නේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවල සේවා සපයන්නන් ද වධහිංසාව  හඳුනාගැනීමට හා ඊට ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් බවයි.

6. **බොහෝ වින්දිත කණ්ඩායම් සඳහා මහජන සහාය නොලැබීම:** සදාචාරාත්මක ඇගයීම් මත බොහෝවිට පදනම් වන්නා වූ මහජන මතය තුළ අඩු ආදායම් ප්‍රජාවන්ට අයත් වින්දිතයින්, ලිංගික ශ්‍රමිකයින්, සම්මතයට අනුකූල නොවන බවක් සලකන ස්ත්‍රී-පුරුෂ සමාජභාව අනන්‍යතා සහිත අය, සිරකරුවන් වැනි පාර්ශවයන් පිළිගැනීමට ලක් නොකරන බවක් පෙනෙයි. මත් ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සමාජයේ ඇති විරෝධය සහ ත්‍රස්තවාදයට සම්බන්ධ යැයි සලකනු ලැබීම ද දිවි ගලවාගත් තැනැත්තන් විසින් තමන් විඳි හිංසන සම්බන්ධයෙන් පැමිණිලි කිරීම මැඩපවත්වන හේතු ලෙස පෙනෙන්නට තිබේ. නීතියට පිටින් දඬුවම් දීම සම්බන්ධයෙන් වන මහජන තෘප්තිය මෙවැනි වරදකරුවන්ට

ශක්තිය දෙන බව හඳුනා ගන්නා ලදී. දිවි ගලවාගත් තැනැත්තන් අපකීර්තියෙන් හා ප්‍රහාරවලින් ආරක්ෂා කිරීමට රාජ්‍ය ආයතන අපොහොසත් වී ඇති අතර වින්දිතයින්ගේ ගරුත්වය, සුරක්ෂිතබව සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ අදහස් හා ක්‍රියා ප්‍රසිද්ධ තලයේ ප්‍රවර්ධනය කිරීමට ද අපොහොසත් වී තිබේ.

**7. ආරක්ෂාවක් නොමැතිවීම සහ රජයේ ප්‍රතිචාරය ප්‍රමාණවත් නොවීම**

**අ. ආරක්ෂණ සේවා නොමැතිවීම:** ශ්‍රී ලංකාවේ වධහිංසාවට ලක් වී දිවි ගලවාගත් තැනැත්තන්ට නිසි කලට හා ඵලදායී අන්දමින් ආරක්ෂාව සහ යථාතත්වයට ඒම සඳහා සහාය දෙන රජයේ අනුග්‍රහය සහිත වැඩසටහන් නොමැත. එමෙන්ම ආරක්ෂණ සේවා සම්බන්ධයෙන් වන රජයේ මැදිහත්වීම් කෙරෙහි ඇති විශ්වාසයෙහි ද අඩුවක් පවතී.

**ආ. උපකාර නොමැතිවීම:** සහන ලබාදීමේ යන්ත්‍රණ සමග සම්බන්ධ හා ඒ සඳහා වගකිව යුතු වන නිලධාරීන් මෙම දිවි ගලවාගත් තැනැත්තන්ට සහායදීමට යොමු වී නැතිබව සොයාගන්නා ලදී. සිදුවීමක් පිළිබඳ අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත සහ මහේස්ත්‍රාත් වෙත වාර්තා කළ විට එය නිල පැමිණිල්ලක් බවට, විමර්ශනයක් බවට හෝ දිවි ගලවාගත් තැනැත්තාට ලබාදෙන සහායක් බවට පරිවර්තනය නොවේ. තමන්ගේ පැමිණිල්ල සම්බන්ධයෙන් ගත් පියවර කවරේදැයි දිවි ගලවාගත් තැනැත්තන් වෙත තොරතුරු ලබාදෙනු නොලැබේ. වධහිංසා සම්බන්ධයෙන් අපරාධ නඩු ක්‍රියාමාර්ග මෙහෙයවීමේදී නීතිපතිවරයා පළිගැනීමේ ක්‍රියා හේතුවෙන් දිවිගලවාගත් තැනැත්තා සහ නඩුව මත ඇතිවියහැකි බලපෑම සැලකිල්ලට ගනු නොලබයි. අයිතිවාසිකම් උල්ලංඝන සම්බන්ධයෙන් තීන්දු ලබාගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරන නඩුවලදී කාලය සම්බන්ධයෙන් වන සීමා, ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරීන් වගකිව යුතු බව දිගින් දිගටම සහතික කිරීමට අපොහොසත්වීම, රජය සතුව ඇති තමන්ට වාසිසහගත සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කරන්නට නොහැකිවීම ඇතුළු අභියෝගවලට දිවිගලවාගත් තැනැත්තන්ට මුහුණ දෙන්නට සිදුව තිබේ.

## රජයට ඉදිරිපත් කරන ප්‍රතිපත්ති නිර්දේශ

(අ.) නැවතත් යථා තත්වයට පත්වීම සඳහා පරිපූර්ණ වූත් වින්දිතයා කේන්ද්‍ර කරගත්තා වූත් ප්‍රවේශයක්, සහ (ආ) යුක්තිය කරා සුරක්ෂිතව හා ඵලදායී ලෙස ප්‍රවේශවීම යන අරමුණු දෙක සාක්ෂාත් කරගැනීම සඳහා වධහිංසාවලට මුහුණ දී දිවිගලවාගත් තැනැත්තන්ට ඵලදායී ලෙස ආරක්ෂාව ලබාදීම සහතිකකළයුතු යැයි යෝජනා කෙරේ.

1. **නැවතත් යථා තත්වයට පත්වීම සඳහා පරිපූර්ණ වූත් වින්දිතයා කේන්ද්‍ර කරගත්තා වූත් ප්‍රවේශයක්:දිවිගලවාගත් තැනැත්තන් සහ ඔවුන්ගේ පවුල්වලට එම වධහිංසා හෝ පීඩාකාරී සැලකිලි සිදුවීමෙන් පසු නැවත යථාතත්වයට පත්වීම සඳහා සහාය සහ ආරක්ෂාව ලැබිය යුතු වේ. ඒ සඳහා රජය පහත ක්‍රියාමාර්ගය ගැනීම උචිත යැයි නිර්දේශ කෙරේ:**

   **වධහිංසාවලට මුහුණ දී දිවිගලවාගත් තැනැත්තන් සහ ඔවුන්ගේ පවුලේ අය වෙනුවෙන් ඔවුන් නැවතත් යථාතත්වයට පත්කිරීම හා ආරක්ෂාව ලබාදීම සඳහා රජයෙන් සම්පත් යොදා, වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීසඳහා වූ ජාතික අධිකාරිය විසින් සිදුකරන බහු-ආංශික වැඩසටහනක් ක්‍රියාවේ යෙදවීම.** එම වැඩසටහනෙන් (ශාරීරික, චිත්තවේගීය, මූල්‍ය සහ සමාජ වශයෙන්)  යථා තත්වයට පත්වීම සඳහා සහාය ලබාදිය යුතු අතර රාජ්‍ය අංශයේ මනෝවිද්‍යා වෘත්තිකයින් ඒ සඳහා පුහුණු කිරීම සහ ද්විතියික වින්දිතකරණයෙන් බලපෑමට ලක් වූ පවුලේ අය හා අන් අය වෙත සහාය ලබාදීම සිදුකළ යුතු වේ. එසේම ඔවුන් නැවත සමාජයට අනුකලනය කරන්නට සහාය දෙමින් ඔවුන්ව ප්‍රජාවන් සමගින් කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන වෙත යොමුකිරීමේ ක්‍රමවේදයක් සඳහා ද විධිවිධාන සැලසිය යුතු වේ. වධහිංසා සහ පීඩාකාරී සැලකිලි සිදුකිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වන රාජ්‍ය ආයතනවලින් ස්වාධීනව මෙම වැඩසටහන ක්‍රියාත්මක වන බව සහතික වන අන්දමින් මෙම වැඩසටහන සැලසුම් කළයුතු වේ.

2. **යුක්තිය කරා සුරක්ෂිතව හා ඵලදායී ලෙස ප්‍රවේශවීම:යුක්තිය කරා අර්ථවත් ලෙස ප්‍රවේශවීම සහතික කිරීමට වධහිංසා වලින් දිවිගලවාගත් පුද්ගලයින් අත්විඳින නැවතත් වින්දිතභාවයට පත්වීම සහ පළිගැනීමට ලක්වීම ආමන්ත්‍රණය කරන බව සහතික කරගත යුතු වේ. ඒ සඳහා පහත ක්‍රියාමාර්ගය නිර්දේශ කරනු ලැබේ:**

   **වධහිංසාවට මුහුණ දී දිවි ගලවාගත් තැනැත්තන් සම්බන්ධයෙන් කටයුතු කරන සියළු රජයේ ආයතන වධහිංසාවට ලක්වී දිවි ගලවාගත් අය සම්බන්ධයෙන් විශේෂිත රැකවරණ බැඳීම් ඇතිකරවන ආයතනික ප්‍රතිපත්ති සකස් කර, පනවා ක්‍රියාත්මක කිරීම.** පොලීසිය, බන්ධනාගාරය, රාජ්‍ය පරිපාලනය, අධිකරණය, අධිකරණ වෛද්‍ය නිලධාරීන් හා සෞඛ්‍ය පරිපාලනය, නීතිපති දෙපාර්තමේන්තුව, වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය, ජාතික පොලිස් කොමිසම, නීති ආධාර කොමිසම, සහ ජාතික මානව හිමිකම් කොමිසම විසින් එම ආයතනවලට විශේෂිත ප්‍රතිපත්ති සම්මත කරගත යුතුය. සුරක්ෂිත සහ විනිශ්චයකින් තොරව ලබාදෙන සහාය අවධාරණය කිරීම, දිවි ගලවාගත් තැනැත්තන් නැවතත් යථා තත්වයට පත්කිරීම සඳහා ප්‍රමුඛතාවය සහ කේන්ද්‍රස්ථානය ලබාදීම, පැමිණිලි සම්බන්ධයෙන් නීතියෙන් නියම කර ඇති කාල සීමා ඉවත් කිරීම, දිවි ගලවාගත් තැනැත්තන්ගේ කැමැත්තෙන් සහ ඔවුන්ගේ සහයෝගයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම මෙම ප්‍රතිපත්ති හරහා අවධාරණය කළයුතු වේ. දිවි ගලවාගත් අය මුහුණ දෙන තර්ජන සහ පළිගැනීම් විශේෂයෙන් හඳුනාගැනීමටත්, ආමන්ත්‍රණයටත් මෙම ප්‍රතිපත්ති මගින් කටයුතු කළයුතු වේ.

Dignity ආයතනය සහ එඩින්බර්ග් විශ්වවිද්‍යාලය සමග එක්ව මෙම සංක්ෂිප්ත ප්‍රතිපත්ති සටහන සම්පාදනය කරන ලදී.

LAW & SOCIETY TRUST

මෙම සංක්ෂිප්ත ප්‍රතිපත්ති සටහනෙහි ප්‍රකාශිත අදහස්, කතුවරයින්ගේ අදහස් වන අතර Dignity ආයතනයේ හෝ එඩින්බර්ග් විශ්වවිද්‍යාලයේ නිල ස්ථාවරයන් නියෝජනය නොකරයි.

**වැඩිදුර තොරතුරු සඳහා කතුවරයින් සමගින් සම්බන්ධ වන්න:**
අර්මිසා
ටීගල්:ermiza@gmail.comත්‍යාගි
පියදස:thiagip@gmail.com

**Law and Society Trust**
**3, Kynsey Terrace,**
**Colombo 8,**
**Sri Lanka**

**Tel: + 94 (0) 112684845**
**Fax: +94011-2686843**
**Email: admin@lstlanka.org**
**www.lstlanka.org**